## නීති ආධාර සේවා



සංකූට්ටනයට ගොදුරු වූ ස්වාමිපුරුෂයින් හෝ භාර්යාවන්ගේ නඩු වලදී, සිවිල් පටිපාටිකරයකට එළැඹීම සඳහා නීති ආධාර සේවය LAD වෙත ඔබට අයදුම් කළ හැකිය. සංකූටිත ස්වාමිපුරුෂයකු හෝ භාර්යාවකට, හිරිහැර වළක්වන නියෝගයක්, පහ කිරීමේ නියෝගයක් හෝ අදාළ අවස්ථාවලදී තහනම් නියෝගයක් හෝ ඔහු/ඇය ඒ ගැන තිරණයක් ගතහොත් දික්කසාදයක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිදිපත් කළ හැක. නීති ආධාර සඳහා සුදුසුකම් ලැබීම සඳහා වත්කම් හා සුදුසුකම් පරීක්‍ෂණ යන දෙකම පිළිබඳව සෑහිමකට පත් විය යුතුව ඇත.

නීති ආධාර සඳහා හදිසි අයදුම් කිරීමක් වෙනුවෙන්, උදාහරණ වශයෙන් සිද්ධියකට ගොදුරු වූ අයෙකුට හිරිහැර වැළැක්වීමේ නියෝගයක්, පහ කිරීමේ නියෝගයක් හෝ තහනම් නියෝගයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය නම්, වත්කම් පරීක්‍ෂණය සහ කටළුත්තරයක් ලබා ගැනීම පිණිස, LAD මගින් හැකි ඉක්මනින් ඔබට සම්මුඛ පරීක්‍ෂණයක් ලබා දෙනු ඇත.

පරිභවයට ගොදුරුවූවන්, වත්කම් සහ යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වීමෙන් අනතුරුව, සුදුසු නෛතික ක්‍රියාමාර්ගයක් දියත් කිරීම සඳහා LAD මගින් නිකුත් කරනු ලබන නීති ආධාර සහතිකය ද ලැබුණු පසුව, පත් කරන ලද නීතිඥයා එම තැනැත්තාගේ උපදෙස් පරිදි ක්‍රියා කරනු ලබන අතර ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳව ඔහුට/ඇයට උපදෙස් ලබා දෙනු ඇත. මේ අතර, නියම කරන ලද නීතිඥයා පරිභවයට ගොදුරු වූ අයගේ නෛතික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා සුදුසු නීතිමය පිළිවෙත් අනුගමනය කරනු ඇත. අවශ්‍ය අවස්ථාවකදී, නීතිඥයා සමඟ හදිසි සම්මුඛ සාකච්ඡාවක් සලසා දෙනු ලැබේ. අධිකරණ පටිපාටිකරය පිළිබඳව සිද්ධියට ගොදුරු වූ තැනැත්තා පූර්ණ වශයෙන් දැනුවත් කරනු ලැබේ.

## ප්‍රධාන විමර්ශන ක්‍ෂණික ඇමතුම් අංක

| සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුව | දුරකථන අංකය |
|---|---|
| Hotline SWD | 2343 2255 |
| Family and Child Protective Services Unit (Central Western, Southern and Islands) | 2835 2733 |
| Family and Child Protective Services Unit (Eastern and Wanchai) | 2231 5859 |
| Family and Child Protective Services Unit (Kwun Tong) | 2707 7681 |
| Family and Child Protective Services Unit (Wong Tai Sin and Sai Kung) | 3188 3563 |
| Family and Child Protective Services Unit (Sham Shui Po) | 2247 5373 |
| Family and Child Protective Services Unit (Kowloon City and Yau Tsim Mong) | 3583 3254 |
| Family and Child Protective Services Unit (Shatin) | 2158 6680 |
| Family and Child Protective Services Unit (Tai Po and North) | 2158 6696 |
| Family and Child Protective Services Unit (Tuen Mun) | 2618 5710 |
| Family and Child Protective Services Unit (Tsuen Wan and Kwai Tsing) | 2940 7350 |
| Family and Child Protective Services Unit (Yuen Long) | 2445 4224 |

### කාන්තාවන් සඳහා සරණ මධ්‍යස්ථාන

| | |
|---|---|
| Wai On Home for Women | 2793 0223 |
| Harmony House | 2522 0434 |
| Serene Court | 2787 6865 |
| Sunrise Court | 2890 8330 |
| Family Crisis Support Centre 24-hour Hotline | 18288 |
| CEASE Crisis Centre 24-hour Hotline | 18281 |

### වෙනත්

| හොං කොං පොලිස් බලකාය | |
|---|---|
| හදිසි දුරකථන ඇමතුම් අංකය | 999 |


| නීති ආධාර දෙපාර්තමේන්තුව | |
|---|---|
| ක්‍ෂණික ඇමතුම් | 2537 7677 |

ළමා අපචාර, ස්වාමිපුරුෂයා හෝ භාර්යාවගේ සංකූට්ටනයට ලක් වූවන් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ අයට සහාය ලබා දීම සම්බන්ධ වෙබ් අඩවිය
http://victimsupport.swd.gov.hk

This leaflet is available in the following languages:

1. Chinese
2. English
3. Tagalog
4. Indonesia
5. Thai
6. Hindi
7. Nepali
8. Sinhalese
9. Urdu

මෙම පිටපත් සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය
http://www.swd.gov.hk/



# ර ඒසංකූට්ත ස්වාමිපුරුෂයින් සහ භාර්යාවන් සඳහා සහායක සේවා

Support Services to
BATTERED SPOUSE CASES

Sinhalese / 斯里蘭卡文

August 2007

社會福利署
Social Welfare Department

හොං කොං හි දී, පරිභවයට ගොදුරු වූවන්ට, පරිභවය සිදු කරන්නන්ට හෝ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් පරිභවයට ලක් වූ අයගේ පවුල් සඳහා, සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුව (SWD), රාජ්‍ය නොවන සංවිධාන (NGO), පොලිසිය සහ නීති ආධාර දෙපාර්තමේන්තුව (LAD) ආදිය මගින් සේවා රැසක් ම සපයනු ලැබේ.

## පවුල් සහ ළමා ආරක්ෂක සේවා ඒකක

සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුවේ (SWD) පවුල් සහ ළමා ආරක්ෂක සේවා ඒකක (FCPSU), විශේෂ ඒකක වන අතර, පරිභවයට ගොදුරු වූවන්ට, පරිභවයෙහි නිරත අයට සහ/හෝ ළමා අපචාර වලට මුහුණ දුන් පවුල් වලට සහ (සංකූටිතනය හා සම්බන්ධ) අවස්ථාවන් වලදී, විවිධ සේවාවන් පෙළක්ම ලබා දෙන සාමාජ සේවකයින්ගෙන් සමන්විත වේ. ඒ ඒ අවස්ථාවන් අනුව, සාමාජ සේවකයන් පිටස්තර සුභ සාධන, සාමාජයීය විමර්ශන, අර්බුදයක දී මැදිහත් වීම, එක් එක් අවස්ථාව සඳහා උපදෙස් ලබා දීම සහ කණ්ඩායම් ප්‍රතිකාර ආදිය ලබා දෙනු ඇත. තවද, රැකවරණය හා භාරකාරත්වය සම්බන්ධ ගැටළු වලට මුහුණ පෑමට සිදු වන දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා, අධිකරණයක් මගින් නියෝග කර ඇති පරිදි අධිකරණය සඳහා FCPSU මගින් සාමාජයීය විමර්ශන වාර්තා සකස් කරනු ලැබේ. එමෙන්ම, අධිකරණ නියෝග වලට අනුකූලව ළමුන් නිතිමය ආකාරයෙන් අධීක්ෂණය කිරීම එමගින් සිදු කෙරෙනු ඇත. අවශ්‍ය විටෙකදී, මූල්‍යමය ආධාර සඳහා යොමු කිරීමක්ද, නිවාස, නීති ආධාර, මනෝමය උපදේශනය සහ පාසැල් කටයුතු පිළියෙළ කිරීම ආදිය ද සිදු කරනු ලබනු ඇත.

## සංකලිත පවුල් සේවා මධ්‍යස්ථාන

සාමාජ සුභ සාධන දෙපාර්තමේන්තුව (SWD) සහ රාජ්‍ය නොවන සංවිධාන (NGO) මගින් පවත්වාගෙන යනු ලබන ඉන්ටිග්‍රේටඩ් ෆැමිලි සර්විස් සෙන්ටර් හෙවත් සංකලිත පවුල් සේවා මධ්‍යස්ථාන (IFSC), අවශ්‍යතා සහිත, තනි පුද්ගලයින්ට සහ පවුල් වලට අඛණ්ඩ, වැළැක්වීමේ, සහාය ලබාදීමේ සහ ප්‍රතිකාර්මික සේවාවන් ලබා දෙනු ඇත. එය, පවුල් සම්පත් මධ්‍යස්ථානයක්, පවුල් සහායක මධ්‍යස්ථානයක් සහ පවුල් උපදේශන මධ්‍යස්ථානයකින් සමන්විත වේ. එමගින් පවුල් ජීවිතය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම, දෙමාපිය-දරු ක්‍රියාකාරකම්, විමර්ශන සේවාව, ස්වේච්ඡා සේවක පුහුණු කරීම්, පිටස්තර සුභ සාධන සේවා, අන්‍යෝන්‍ය ආධාරක කණ්ඩායම්, එක් එක් අවස්ථාව සඳහා උපදේශනය ආදිය ඇතුළුව, සේවා රැසක්ම සපයනු ලබයි. තවද, එක් එක් තනි අවස්ථාවන් වල අවශ්‍යතාවයන් මත පදනම්ව, ප්‍රජා සහාය හෝ නේවාසික රැකවරණ සේවා, මූල්‍යමය ආධාර, මනෝමය සේවා, රැකියා සේවා ආදී වෙනත් සේවාවන් වෙත, සාමාජ සේවකයින් විසින් යොමු කෙරෙනු ඇත.

## වෛද්‍ය සාමාජ සේවා

රෝහල් කාර්ය මණ්ඩලය, පොලිසිය හෝ වෙනත් සංවිධාන සහ රෝගින් හෝ ඔවුන්ගේ පවුල් වල සෘජු ඉදිරිපත් වීම මගින්, පොදු රෝහල් වල සහ විශේෂඥ බාහිර-රෝගී සායන වල වෛද්‍ය සමාජ සේවකයින් වෙත පවුල් වල ප්‍රචණ්ඩත්වය පිළිබඳව අවධානය යොමු කෙරෙනු ඇත. ඔවුන්ගේ අවශ්‍යතා මත පදනම් ව පවුල් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ට උපකාර කිරීම සඳහා, වෛද්‍ය සාමාජ සේවකයින් උපදේශනය හා ප්‍රත්‍යක්ෂ සේවාවන් සපයනු ලබන අතර පුනරුත්ථාපනය, ප්‍රජා සේවා සඳහා යොමු කිරීම ආදිය ද කරනු ලබයි.

## කාන්තාවන් සඳහා සරණ මධ්‍යස්ථාන



ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණ පෑමේ අවදානමක් ඇති හෝ පවුලේ අර්බුදයකට මුහුණ පා සිටින කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන් සඳහා තාවකාලික නවාතැන් සහ ආධාර සේවාවන් සපයන කාන්තාවන් සඳහා සරණ මධ්‍යස්ථාන හතරක් හොං කොං හි පිහිටුවා ඇත. ඒවා නම්, කාන්භාවන් වෙනුවෙන් වායි ඔන් නිවාසය, හාමනි හවුස්, සෙරීන් කෝට් සහ සන්රයිස් කෝට් ය. මෙම සේවාව අවශ්‍ය කාන්තාවන් සඳහා, පැය විසිහතර පුරාවටම ඇතුළු වීම් වලට ඉඩ සලසන අතර, සාමාජ සේවකයින් විසින්, පොලිසිය හෝ රෝහල් විසින් යොමු කිරීම් තුළින් ද සෘජුව ම අයදුම් කිරීමෙන් ද භාර ගනු ලැබේ. සරණ මධ්‍යස්ථාන වල ලිපිනයන් රහසිගත වේ.

## පවුල් අර්බුද පිනිටාධාර මධ්‍යස්ථානය

කැරිටාස්- හොං කොං මගින් පවත්වා ගෙන යනු ලබන, පවුල් අර්බද පිහිටාධාර මධ්‍යස්ථානය (FCSC) මගින් කලකට වෙන්ව සටීමේ පහසුකම් සහ දැඩි පීඩනයකට යටත් ව සිටින හෝ අර්බුදයකට මුහුණ පා සිටින අයට, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතුළුව, පවුලේ ප්‍රශ්න වලට ධනාත්මක විසඳුමක් සෙවීම ට උපකාර කිරීම සඳහා සංකලිත සේවා පොදියක් සපයා දෙනු ලැබේ. සෘජු අයදුම් හෝ ඕනෑම සංවිධානයක් මගින් කෙරෙන යොමු කිරීම FCSC මගින් භාර ගනු ලැබේ.

## ක්ෂණික ඇමතුම් සේවාවන්

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ අයට සුභ සාධන සේවාවන් පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහාත් කාලෝචිත උපදෙස්/සහාය ලබා ගැනීමටත් මෙම ක්ෂණික දුරකථන ඇමතුම් සේවාවන් භාවිතා කළ හැකිය. මෙම ක්ෂණික දුරකථන ඇමතුම් මාර්ග මෙහෙයවනු ලබන්නේ සාමාජ සේවකයන් හෝ ස්වේච්ඡා සේවකයන් මගින් හෝ ඇමතුම් මාරු කෙරෙන පද්ධතියක් මගින් ය.

## පොලිසිය මැදිහත් වීම



ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සියළුම පැමිණිලි සහ වාර්තා සම්බන්ධයෙන් සොයා බලා ඒවා විමර්ශනය කරනු ලබන්නේ හොං කොං පොලිස් බලකාය විසින් ය. සාමාන්‍ය තත්වයන් යටතේ දී, ඕනෑම පොලිස් ස්ථානයක් ඇමතීමෙන්, පොලිස් ක්ෂණික දුරකථන ඇමතුම වන 2527 7177 ඇමතීමෙන් හෝ ඕනෑම පොලිස් නිලධාරියකු වෙත සෘජුවම ප්‍රවේශ වීමෙන් පැමිණිලි කළ හැකිය. හදිසි අවස්ථාවකදී, ආධාර ලබා ගැනීම සඳහා පොදු ජනතාවට '999' අංකය ඇමතිය හැකිය. ගොදුරු වූ අයගේ සහ දැනුම් දෙන්නන් පිළිබඳ තොරතුරු රහසිගතව තබා ගනු ඇත.

## සායනික මනෝමය සේවා

මානසික රෝග ලක්ෂණ පෙන්නුම් කරන පරිභවයට ගොදුරු වූවන්ට, පරිභවය සිදු කරන්නන්ට සහ/හෝ ඔවුන්ගේ දරුවන්ට, තක්සේරු සහ ප්‍රතිකර්ම සේවා, SWD හි සායනික මනෝවිද්‍යාඥ ඒකක හතරේ සායනික මනෝවිද්‍යඥයින් විසින් සැපයේ. සියළුම SWD ඒකක මගින් කෙරෙන යොමු කිරීම භාර ගනු ලැබේ. එක් එක් අවස්ථාවට අනුව, ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් සංකූටිතනයට ලක් වීම හේතුවෙන් ඇති වූ මානසික ගැටළු, සේවාලාභියන්ට පාලනය කිරීමට උපකාර කිරීම සඳහා සායනික මනෝවිද්‍යාඥයින් පුද්ගලික, ජෝඩු/පවුල් හෝ කණ්ඩායම් වශයෙන් ප්‍රතිකාර ලබා දෙනු ලැබේ. දික්කසාද නඩු වල දී, ඇතැම් විට සායනික මනෝවිද්‍යාඥයින් මානසිකත්වය පිළිබඳ තක්සේරුවක් කරනු ලබන අතර භාරකාරත්වය, ප්‍රවේශය සහ/හෝ ළමුන්ගේ රැකවරණය සලසා දීම සම්බන්ධ කරුණු පිළිබඳ විශේෂඥ නිගමනයන් අධිකරණයට ලබා දෙනු ඇත.

## මූල්‍යමය ආධාර



ද කොම්ප්‍රිහෙන්සිව් සෝෂල් සිකියුරිටි ඇසිස්ටන්ස් (CSSA) ස්කීම් නොහොත් ව්‍යාප්ත සමාජයීය සුරක්ෂිතතා ආධාර ක්‍රමය නිර්මාණය කර ඇත්තේ අවශ්‍යතාවන් ඇති අයට මූල්‍යමය ආධාර සැපයීම සඳහා ය. ඒ සඳහා සුදුසුකම් ලැබීම සඳහා, අයදුම්කරු හොං කොං හි අවම වශයෙන් වසර හතක් හෝ පදිංචිකරුවකු වී සිටිය යුතු අතර අයදුම් පත්‍රයෙහි දිනයට පෙර, ආසන්නයේදීම හොං කොං හි අවම වශයෙන් වසරක් හෝ අඛණ්ඩව පදිංචිව සිටිය යුතුව ඇත. විශේෂිත අවස්ථා යටතේ, සඳහන් කර ඇති, පදිංචිය පිළිබඳ අවශ්‍යතාවන් සපුරාලන්නේ නැති CSSA අයදුම්කරුවකුට, සාමාජ සුභ සාධන අධ්‍යක්ෂවරයාගේ අභිමතය මත ආධාර ලබා දෙනු ඇත. ඔබට CSSA සඳහා අයදුම් සඳහා නිර්දේශයක්, යොමු කිරීමක් ලබා ගැනීමට සමාජ සේවකයකු වෙත හෝ සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුවෙ (SWD) හි සාමාජයීය ආරක්ෂක ක්ෂේත්‍ර ඒකක වෙත පුද්ගලිකව යා හැකිය.

තවද, හදිසි අවස්ථා වලදී තමන්ගේ මූල්‍යමය අපහසුකම් පියවා ගැනීම සඳහා වෙනත් මූල්‍යමය ආධාර ලබා ගත නොහැකි විටෙකදළ, පුණ්‍යාධාර භාරකාර අරමුදල් මගින් තාවකාලික මුදල් පිරිනැමීම් තනි පුද්ගලයින්ට හෝ පවුල් වලට ලබා දෙනු ඇත. එක් එක් පුණ්‍යාධාර භාරකාර අරමුදල් වලට තම තමන්ගේ නිර්ණායකයන් සහ ආධාර ලබා දීමේ ප්‍රභේදයන් ඇත. මෙවැනි ආධාර අවශ්‍ය පුද්ගලයින් සාමාජ සේවකයන් මාර්ගයෙන් හෝ සමාජ සුරක්ෂිතතා ක්ෂේත්‍ර ඒකක මාර්ගයෙන් අයදුම් කළ හැකිය.

## කාරුණික නැවත පදිංචි කරවීම

කාරුණික නැවත පදිංචි කරවීම හෙවත් කම්පැෂනේට් හවුසිං, තමාට විසඳා ගත නොහැකි, අව්‍යාජ සහ නිවාසවල වහා අවශ්‍යතාවයක් ඇති තනි පුද්ගලයින් සහ පවුල් සඳහා උපකාර කිරීම අරමුණු කොට ගත් නිවාස ආධාර ක්‍රමයකි. තමාගේ දික්කසාද අයදම පිළිබඳ අධිකරණ තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතර සහ දරුවාගේ හෝ දරුවන්ගේ භාරකරත්වය ලබා ගන්නා අයට ආධාර කිරීම සඳහා කොන්දේසිගත කුලීනිවැසියාව සඳහා මෙම ක්‍රමය යටතේ නිර්දේශ කිරීමේ හැකියාව ද ඇත. 2001 නොවැම්බර් මස සිට, නිවාස දෙපාර්තමේන්තුව, මෙම කොන්දේසිගත කුලීනිවැසි ක්‍රමය, දරුවන් නොමැති හෝ වෛවාහික නිවස අත හැර යාමේදී ඔවුන් මත යැපෙන දූදරුවන් රැගෙන නොපැමිණි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ අය ආවරණය කිරීම සඳහා ද ලබා දී ඇත. මෙම සේවාව අවශ්‍ය අය, අදාළ සමාජ සේවකයන් වෙත අයැදුම් කළ හැක.

